# මිහිදන් කරනු කෙලෙසද ඔබ අද මිතුර.....



නොසිතූ මොහොතක ජීවිතයෙන් සමුගත් **පාලිත ගුණසේකර** හිතවතාණන්ගේ මූලිකත්වයෙන් මුළු මහත් සමාජයට වූ සත්කාරය බොහෝයි

මීට අවුරුදු 30 කට විතර කලින් යහළුවෝ කීපදෙනෙක් ස්වේච්ඡාවෙන්ම එකතුවෙලා අපූරු කටයුත්තකට මුල පිරුවා. ඔවුන්ට දැනුනා අපේ රටේ වගකීම් බාරගන්න ඉන්නා තරුණ පිරිස් අකාලයේ යම් යම් දේවලට ගොදුරු වී ඔවුනගේ අනාගතය අඳුරට යෑමේ ඉඩකඩ වැඩි විත්තිය. ඒ වගේම පැහැදිලිව දුටු දෙයක් තමයි ආදරයක්, අනුකම්පාවක්, සෙනෙහසක්, නිසි අධ්‍යාපනයක්, මව් පිය හව්හරණක් නොමැතිව ඉබාගාතේ ඇවිදින වීදියට සීමා වූ ළමුන්,

ඒ විතරක් නොවෙයි යුධමය තත්වයන් මත දෙමාපියෙක්,නෑයෙක්, සහෝදරයෙක් නොමැතිව අනාත වූ ළමුන්. අංග විකලවූ ළමුන්, දෙමාපියන් මහමග දමා ගොස් ඇති ළමුන්. පරිවාර හා ළමා රක්‍ෂක දෙපාර්තුමේන්තුවේ වගකීමෙන් අනාත නිවාසයන්ට භාරදී ඇති මෙවැනි ළමුන් නිසා බොහෝ දේවල් මේ හිතවතුන්ට වටහා ගන්නට හැකි වුනා මේ උතුම් වූ කටයුත්තට මුලපුරන්නට. මොවුන් මුල් අදියර පටන් ගන්නේ කොළඹ කොටුවේ YMCA ශාලාවට එකතුවෙලා මේ පිළිබඳව වැඩ කිහිපයක් ම එක් කරමින්. විනීත,ගුණ ගරුක බුද්ධිමත් පුද්ගලයකු හැටියට අනාගතයට මුහුණ දීමට පරිසරය සකස් කරනා පිරිසක් හැටියටයි මේ යහළුවන් එකතුවෙලා FRIENDS (Friends of volunteers) සංවිධානය ගොඩනගන්නෙ. මෙයින් ඇරඹෙන "සෙනෙහස" ව්‍යපෘතිය ශ්‍රී ලංකාවේ ගම් දනව් සිසාරා ළමුනගේ සතුට, සෙනෙහස, රැකවරණය හා යහපත් අධ්‍යාපනික ගුණ වගාවකට මුල පුරමින් දියත් වෙනවා.

මේ කාලය අතරතුර "සෙනෙහස" ව්‍යපෘතියේ සිටි මුල් සාමාජිකයින් කිහිප දෙනෙකු කලින් කල විදේශ ගත වෙනවා අධ්‍යාපන කටයුතු උදෙසා. තවත් අය රැකියාවන් හා පදිංචිය අරඹයා. එනමුදු ආරම්භ කල සියළු කටයුතු එලෙසම වැඩි දියුණුවෙමින් දිනෙන් දින අනෙකුත් සාමාජිකයන් ගේද උනන්දුවෙන් සාර්ථක වෙනවා.
පසුකලකදී පිටරට වෙසෙන සාමාජික පිරිස් ලංකාවට පැමිණ තව තවත් වර්ධන වූ ව්‍යාපෘතීන් කරා ගෙන යන්නට වෙහෙස ගන්නේ දිගු කාලයක සිට අරමුණු කරගත් ප්‍රතිඵලයන් සාර්ථක කරගන්නටයි. ඔවුනගේ ඉලක්කය වන්නේ අසරණකම, අනාත වූ තත්වයන් මගහැර අධ්‍යාපනය දියුණු කර අහිමි සෙනෙහස උපරිම වූ සත්කාරය සලසා ලන්නටයි.

මෙවැන්නක් කරන්නට සුළු පිරිසකින් ගොඩ නැගුණු තනි සංවිධානයක් හැටියට ඔවුනට මහත් වූ වෙහෙසක් දරන්නට සිදුවෙනවා. අනාථ නිවාස වල සිටිනා දූ දැරියන් ව්‍යාපෘති හා කඳවුරු වලට සහභාගී කරගනිමින් ඔවුනගේ සිතැඟි වටහා ගෙන මානසිකව වර්ධනයක් මෙන්ම අධ්‍යාපනික වර්ධනයක්ද ඇති කරනවා.

අද වනවිට "සෙනෙහස" ව්‍යපෘතියේ ප්‍රයත්නයන් ජාත්‍යාන්තර අවධානය පවා යොමුවෙලා තියෙනවා. මෙය කිසිම ජාති ආගම් භේදයකින් තොරව දේශපාලන කතිකාවලින් සබැඳිකම් බැහැර වූ නිර්මල වූ අදිටනින් කෙරෙනා අසරණ ළමුන් සඳහා ගොඩනැගුණු ස්වාධීන සෙනෙහසේ දායාදයක් ලෙසයි ආරම්භකයින් පවසන්නේ.

මේ කඳවුරු තුලදී මානසිකත්වය හා සෞඛ්‍යය තත්වය ඉහලම තලයකට ගෙන ඒම සඳහා දිවයිනේ සුප්‍රකට දේශකයන් ගේ දේශණා වගේම, සංගීතය, චිත්‍ර හා නාට්‍යමය අංග, විවිධ කුසලතා හා ක්‍රීඩා, එදිනෙදා සමාජයේ මුහුණ දෙන්නට වන ගැටළු, රැකියා අවශ්‍යතා හා විවිධ වූ අවබෝධයන් ලබාදෙනවා. අවු 12 සිට 18 දක්වා ගැහැණු පිරිමි ළමුන් දෙපාර්ශවයම සෙනෙහස ව්‍යාපෘතියට ඇතුලත් වෙනවා. මේ ආකාරයට වසරකට ළමුන් 5000-6000 ක් පමණ ඍජුව සහ වක්‍රව කඳවුරු වලට සහභාගී වෙනවා. මේ කර්තව්‍යයේ දී අනාථ නිවාස වලින් කෙරෙනා අගය කිරීම් වගේම ඔවුනගෙන් ලැබෙනා සහයෝගය ඉතාම ප්‍රසංසනීයයි කියා සංවිධායකවරුන් පවසන්නේ.

ඒ වාගේම SRILANKAN ගුවන් සමාගම මගින් ඉතාම ඉහල වූ සත්කාරයක් අසරණ වූ දරුවන්ට සලසා දෙනවා. දුම්රියකින්,බසයකින් ගමනක යෙදුනත් ගුවන් ගමනක් කියන්නේ ලැබෙන මහඟු වාසනාවක්. අසරණ දරුවන්ට තෙවතාවක් මේ වනවිටත SRILANKAN ගුවන් සමාගම මගින් ලබා දී තිබෙනවා යැයි FRIENDS සංවිධානයේ නිර්මාතෘ හා සභාපතිත්වය දරන **පාලිත ගුණසේකරයන්** එදවස මා හා පැවසුවේ ඔවුනට කෘතඥභාවය පළකරමින්.

මේ අතර ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බෙන් නගරයේ වෙසෙන මනෝජ් නිලංග ක්‍රියාකාරීව ළමුනගේ අභිවෘද්ධිය උදෙසා කෙරෙන වැඩසටහන් වලට අනෙකුත් සාමාජිකයන් ද සහභාගී කරගනිමින් නව ව්‍යාපෘතීන් පිළිබඳව අධ්‍යනයක යෙදෙනවා. මේ වනවිටත් ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර විශේෂ වූ ක්‍රියාකාරී පිරිසක් යටතේ "සෙනෙහස" ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා.

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර දායකත්වයෙන්
ස්ටැන්ලි සෙබස්තියන් (සභාපති) තනුජා විජේසේකර(ලේකම්)
යොහාන් පතිනාත(භාණ්ඩාගාරික)
කමිටු නිලධාරීන් ලෙස
ජගත් බණ්ඩාර, පර්සි ගුණසේකර, සාළිය තෙන්නකෝන්, ශ්‍රියාණි තෙන්නකෝන්, ඉන්දි දසනායක, දුමින්ද ඩි සිල්වා, මලීෂා ගුණසේකර, මංගල සිරිවර්ධන, ශ්‍රියාකාන්ති රණසිංහ යන ක්‍රියාකාරීන්ගේ සහය නොඅඩුවම ලැබෙනවා.

FRIENDS සංවිධානයේ නිර්මාතෘ හා සභාපතිත්වය දැරූ **පාලිත ගුණසේකරයන්ගේ** හදිසි නික්ම යෑම සියල්ලෝගේම අවාසනාවක් වගේම කියන්නට බැරි තරම් වේදනාවක්.

**පාලිත ගුණසේකර හිතවතාණෙනි** අද දවසේ හිත මිතුරන් සහෝදර සහොදරියන් ඔබෙන් සරණක් ලැබූ ජනතාවක් වේදනාවෙන් දුකෙන් පසුවන දවසක්. ඔබ අපෙන් වෙන්ව යන මොහොතක්. ඔබේ යහගුණ කවදත් අප අතර සුවඳ විහිදුවාවි.

**දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ උන්වහන්සේගේ තුරුලේ ඔබ සැතපේවා...**
**ස්වර්ගයේ දොරටු විවෘතවේවා...**

සුහදින් පිරුණු සෙනෙහස
වපුරා නිතර....
සත්කාරයෙන් ජනහද
සුවකල සොයුර....
මොහොතින් නික්ම යන
ලොව හැම දේ අතැර....
මිහිදන් කරනු කෙලෙසද
ඔබ අද මිතුර....

අතුල කල්දෙමුල්ල